සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

## තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
## Third Term Test - Grade 13 - 2023

## සිංහල - I

කාලය පැය 03 යි

අමතර කාලය වි. 10යි

- පළමුවන ප්‍රශ්නය ඇතුළු ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න. (මෙම ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ලේඛන ව්‍යවහාරයම යොදා ගන්න.)

---

(01) **පහත දැක්වෙන (අ) , (ආ) , (ඉ) , (ඊ) සහ (උ) උද්ධෘත අතරින් හතරක් තෝරාගෙන ඒ ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට ද (ඌ) සහ (එ) ප්‍රශ්නවලට ද පිළිතුරු සපයන්න. (මේ ප්‍රශ්නයට පිළිතුරු ලිවීමේ දී වර්තමාන ව්‍යවහාරය ම යොදාගන්න.**

(අ) බමුණාණෝ ගෙට ගොසින් බැමිණියන් බණවාලා 'පින්වත, මහණ ගොයුම්හු පවරා ගෙනවුත් දන් වළඳවාලා ප්‍රශ්න විචාරමි. දන් සරහ'යි කියා සම්මත කොටලා වෙහෙරට ගොසින් බුදුන් නොවැඳ ම සාදසාමීචි ලෙස කථාත් නො කොට ම එකත්පස් ව සිට 'භවත් ගෞතමයෙනි, භික්ෂුසංඝයා හා සමඟ අද අපගේ ආරාධනාව තිසා අපගේ ගෙයි දී වැළඳුව මැනවැ' යි කිවූය. බුදුහුත් බොහෝ ප්‍රයෝජන සලකා ආරාධනාවේ අරුමයක් නැතත් ඉවසා වදාළ සේක. බමුණාණෝ බුදුන් ඉවසා වදාළ නියාව දැන වහා ගෙට ගොසින් නැතක් දවස් නියඟ කොට තබාලා බිම තෙමා වස්නා මහ වැස්සක් මෙන් නැතක් කලක් ම තමන් කළවිරු දෙයක් නොවන හෙයින් අරුමයක් සේ දෙන දන යහපත් කොට සැරසූ ය.බුදුන් වහන්සේ ද නකත්තරු පිරිවරා නික්මුණු සඳ පරිද්දෙන් මහණගණා පිරිවරා බමුණාණන්ගේ ගෙට වැඩ පනවන ලද බුදුහස්නෙහි යුගඳුරු මුදුනෙහි වොරජනා ළහිරු මඩලක් මෙන් වැඩහුන් සේක.

i. අදින්න පුබ්බක බමුණා බුදුහිමි හමුවට ගොස් හැසුරුනේ කෙබඳු අයුරින් ද?

ii. බුදුහිමි බමුණාගේ නිවසට වැඩම කළේ කෙබඳු ආකාරයෙන් ද?

iii. ''බුදු හස්නෙහි යුගඳුරු මුදුනෙහි වොරජනා ළහිරු මඬලක් මෙන්'' මෙම පාඨය ලිහිල් බසින් ලියන්න.

iv. 'ගොයම් හු' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 1 × 4 = 04)

(ආ) එකල ස්වාමි දරුවෝ ඔවුන් ආ කාරණ විචාරා මහණවන්නට ආ බව අසා අවසර දුන් සේක. එකල රජදරුවෝ සදෙන කියන්නහු ''ස්වාමිනි, අපගේ කුලෙහි ශාක්‍යයෝ නම් ඉතා මානීයහ. මානයෙන් ම මඩනා ලදහ. නුඹ වහන්සේ වැනියන් පවා නොවඳුම්හයි මත් කළ කුලයෙක උපනුම්හ. අප ද මහණ වූ කල එබඳු වූ මානයෙක් උපනී නම් එකල මහණධම් මුදුන් පැමිණිය නොදෙයි. මේ අපගේ උපාලි නම් කපුවාණන් පළමුව මහණ කොට, අප පසුව මහණ කොටවදාළ මැනැව. එසේ කල ඔවුන් අපි වඳුම්හ; පුදම්හ; සත්කාර කරම්හ; එසේ කල අපගේ අභිමානත් සිඳෙයි ; මහණ ධම් මුදුන් පැමිණෙයි. ඉදින් මතු රාජ්‍යශ්‍රීයෙහි ලෝභයකුදු වී නම් , තොපගේ කපුවාණන් වැඳපුදා නීච ක්‍රියාකොට නැවත රාජ්‍ය කරන්නට අවුදැයි සාක්කියන් අපට පරිභව බෙණෙති' යි කියා දෙවනුව රාජ්‍ය ලෝභය ද දුරුවෙයි; මේ කාරණයෙන් උන් පළමු කොට මහණ කරවා, අප පසුව මහණ කළ මැනැවැ'යි කීහ.

i. ශාක්‍ය වංශිකයන් තුළින් විද්‍යාමාන වන චරිත ස්වභාවය කෙබඳු ද?

ii. ශාක්‍ය කුමාරවරු සදෙනාගේ ඉල්ලීම කුමක් ද?

iii. ''එසේ කල අපගේ අභිමානත් සිඳෙයි; මහණ ධම් මුදුන් පැමිණෙයි.'' මෙම පාඨය ලිහිල් බසින් ලියන්න.

iv. ''කපුවාණන්'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 1 × 4 = 04)

(ඉ) ඒ කිඳුරංගනා තොම රජහු නිරපේක්ෂ ව පලා ගිය නියාව දැන පර්වතයෙන් බැස මහ බෝසත්හු සිප ගෙන ඔසවා පර්වත මුදුනේ ලා බෝධි සත්ත්වයන්ගේ ඉස තමාගේ ඇකයෙහි තබාගෙන අඬන්නී ''මාගේ ප්‍රිය වූ ස්වාමි පුත්‍රයාණෙනි, පෙර නුඹ හා මා හා පර්වත ගුහාදියෙහි සිත් සේ ඔවුනොවුන් හා සනහමින් කෙළ ඇවිද දැන් නුඹ කෙරෙන් වියෝ වූ මම කුමක් කියා ළය සනහම් ද? තව ද හිමියෙනි, පුෂ්ප ඵල පල්ලවයෙන් අලංකෘත වූ වන ලැහැබුන් හා පෙර අප ඇම කෙළ ඇවිද සමන් ලිය මඬුලු හා බලන්නෙම් තොප නොදැක, අපි කෙසේ නම් ඉවසිය හෙම් ද? තව ද ස්වාමි දරුවාණෙනි, නුඹ යෙහෙන් සැතපෙන පිණිස අතුරන ලද තලිස පතුරු හා කොළතිරි හා ගිරිහිසින් වැහෙන ගංහෝ ඇල කඳුරැලියෙහි පෙර අපි බැස නහන තොටවල් ඉඳ කෙළනා ලද වැලිතලා හා කඩා ගොතා පළඳිනා මල් වඩම් හා ඉඳ කෙළි ලිය හෝවිලි බලන්නා වූ මම කෙසේ නම් ළය සැනසිය හෙම් ද?

i. රජු පිටත්ව ගිය පසු කිඳුරිය කුමක් කළේද?

ii. කිඳුරංගනාවට සිය ළය සනසාගත නොහැක්කේ ඇයි?

iii. ''තවද හිමියනි, පුෂ්ඵ ඵල පල්ලවයෙන් අලංකෘත වූ වන ලැහැබුන්'' ...... මෙම පාඨය ලිහිල් බසින් ලියන්න.

iv. ''නිරපේක්ෂව'' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 1 × 4 = 04)

(ඊ) මෙසේ චණ්ඩ පරුෂ අමනුෂ්‍යයෝ පවා සරණාගතයන් කරා පැමිණ ගින්නට ළං විය නොහෙන මැස්සන් මෙන් දුරින් ම දුරු වෙත්. ශරණානුභාවයාගේ මහන්තත්වය ආශ්චර්යය මැයි. ශරණානුභාවය පූර්වාචාරීවරයන් විසිනිදු කියන ලද මැයි. දේව පුත්‍ර මාර , ක්ලේශමාරය, අභිසංස්කාරමාරය, මෘත්‍යුමාරය යන සිව් මරුන් පරදවා ජය ගත්තා වූ මාරසංග්‍රාමය ඇති කරුණාවෙන් වඩන ලද අදහස් ඇති තථාගතයන් වහන්සේ තමහට ශරණ ය යි කවරෙක් නම් ශරණගත නොවේ ද; එම බුදුන් විසින් වදාරන ලද සසර භය නසන බුදුන්ගේ කරුණා ගුණ උපදවා ප්‍රකාශ කරන්නා වූ සද්ධර්මය ම මට ශරණ ය යි කවරෙක් නම් දහම් සරණ නොගනී ද? අමාමහ නිවන් නැමැති අමෘත පානය කළා වූ සද්ධර්ය ධරා ප්‍රකාශ කිරීමට සරු කෙත් ව සිටියා වූ සංඝරත්නය මට පිළිසරණ යයි කවරෙක් නම් ශරණගත නොවේ ද?

i. ගින්නට ළංවිය නොහෙන මැස්සන් මෙන් දුරින් ම දුරු වන්නේ කවරෙක් ද?

ii. සද්ධර්ම ධාර ප්‍රකාශ කරනු ලබන්නේ කවරෙක් විසින් ද?

iii. 'ශරණානුභාවයාගේ මහන්තත්වය ආශ්චර්යය මැයි' - මෙම පාඨය ලිහිල් බසින් ලියන්න.

iv. ''අභිසංස්කාර මාරයා'' - යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 1 × 4 = 04)

(උ) කලා සපිරි මුව සඳ හස කැල්මෙන්
දුලා දිමුතු මුතුහර ගඟු ලැල්මෙන්
බලා සිටින ලිය තම වෙත ඇල්මෙන්
බලා පුළුල් දිගු නුවනඟ බැල්මෙන්

සරා ලකළ කිරුළඟ මිණි රැස් මැද
සරා උදය දිවයුරු බිඹු සිරි ලද
පුරා උදුළ සේසත් සිහසුන් මැද
අරා පවර නරනිඳු වැඩ උන් සඳ

1. කාන්තාවන්ගේ මුහුණ කෙබඳු ස්වරූප ගත්තේ ද?

2. සිහසුන අරා වැඩහුන් රජු පෙනෙන්නේ කෙසේ ද?

3. 'දුලා දිමුතු මුතුහර '' - මෙම පාඨය ලිහිල් බසින් ලියන්න.

4. ''උදුල සේසත් '' යන්නට කෙටි විවරණ සපයන්න. (ලකුණු 1 × 4 = 04)

(උ) පහත සඳහන් උද්ධෘත අතරින් හතරකට අවස්ථා සම්බන්ධය ලියන්න.

i. ''අප්පොච්චි, අප්පොච්චි, මේ මිනිසුන් කියන්නේ ඇත්තක් ද?

ii. ''සිසුන් තිදෙනෙක් නිතර හැසිරෙති
පාසලේ හා අවට පෙදෙසේ''

iii. ''අලුතින් හේනක්වත් කොටන්ඩ යනවා ද?''

iv. ''ස්වාමීනී, මගේ පුතෙක් ඇත.''

v. '' අනික් කළ මනා දෙයකුත් නොපෙනේ''

vi. ''මැගෙන් මට ප්‍රයෝජන නැත''

vii. ''උඩු මාලේ දෙවඟනක සේ සිටින්නෝ කවුරු ද?'' (ලකුණු 3 × 4 = 12)

(ඌ) භාෂා භාවිතය හා කාව්‍ය දර්ශනය පිළිබඳ අවදානය යොමු කරමින් පහත දැක්වෙන කාව්‍ය නිර්මාණයෙහි සාහිත්‍යමය අගය විමසන්න.

සිහිලැල් සිනාවට උණු කඳුළු නැවුණා
කඳුළෙහි සියුම් දහමෙක රසය ගැවුණා
උස් කඳු මුඳුන් ගන මීදුමක පා වුණා
අරුණාලෝකයක් ඇඳිරියට යා වුණා

කළු ගල් පවා වන මල් පෙති මෙන් මුදු වේ
දවසෙක එහෙත් මල් පෙති කළු ගල් බඳු වේ
ලුහුබැඳ ගමන් ගත් අදහස් ඇත පොදුවේ
සිතු දෙය නොසිදු වේ නොසිතුව දෙය සිදු වේ

හෙල් තැනිතලාවල උඳුවප් දුරුතු මහේ
ලස්සන දැකුම්කලු දේ අද බැලිය නොහේ
හිරිමල් හලන්නට ගඟ බඩ ඇටඹ ගහේ
මින් පසු නො ඒවා සීතල සුළඟ මෙහේ

උස් කඳු මුදුන්වල වැජඹෙන සිරිමලිය
ඔබගෙන් අලුත් දහමක් මට පැහැදිලිය
රූමත් මුහුණකට ඇති මිහිරි ම එළිය
සිහිලැල් සිනා රැළි නොව උණු කඳුළැලිය

රහසක් අනුව ඔබ හදවත ඔබට නොකී
මා ගැන අඳුරු සෙවනැලි හැම තැන ම දකී
පිය සටහන් ඇතත් කඳු හෙල් අතර මැකී
ගී හඬ ඔබට වා මඬලින් ඇසිය හැකී

කඳු බැවුමේ දිය වැල් ගල් කුළෙක හැපී
වෙන් වී ගලාගෙන ගොස් දෙකඩකට කැපී
නැවතත් එකතු වන මෙන් පෙණ බුබුළු පිපී
කවදා කොතනකදී හෝ මුණගැහෙමු අපි
දේදුනු - වළාකුළු කඳුගැට දකින තුරු

බොල් පිනි පොකුරු - හිරිකඩ වැසි වැටෙන තුරු
මීදුම ගලන තුරු වන මල් පිපෙන තුරු
ඔබ අමතක නොවේ කළු ගඟ ගලන තුරු

මුළු ලොව කිසිවකුට කිසි දවසකදී මතු
රහසක් නො වේවා! යට ගිය යුගයේ තතු
ඔබගේ හේළි කිවි මැඳුරෙහි දවල බිතු
තිබුණා වගේමයි වෙනසක් නොවිය යුතු

සැඟවුණ ගිනි පුපුර අළු යට නිවේ නම්
ඊ මත අලුත් සිසිලක් කිති කැවේ නම්
මේ දිවි ගමන කෙටි මඟකට ගෙවේ නම්
හමු වනුවට අගෙයි, යළි හමු නොවේ නම් (ලකුණු 12)

(02) **පහත (අ) කොටසේ ප්‍රශ්නය සහ (ආ) කොටසින් එක් ප්‍රශ්නයක් තෝරාගෙන පිළිතුරු සපයන්න.**

(අ) කෝට්ටේ - ගම්පොළ අවධින්හි සාහිත්‍ය විවිධාංගීකරණය පිළිබඳ ව හැඳින්වීමක් කරන්න.
(ආ) කතාව රසවත් කිරීමෙහි ලා අවස්ථා නිරූණයෙහි සද්ධර්මරත්නාවලි කතුවරයා දැක් වූ දක්ෂතාව නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් විමසන්න. (ලකුණු 7)

<u>නැතහොත්</u>

''යහපත් සමාජයක් ගොඩනැගීම සඳහා ද මානව ගුණ ධර්ම වර්ධනය කිරීම සඳහා ද ජාතක කතාකරුවා සමත් වේ.'' නිර්දිෂ්ට කථා ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 8)

(03) ''ගැඹුරු දහම් කරුණු ඉතා සරලව රසවත්ව ඉදිරිපත් කිරීම නිසා බොහෝ ශ්‍රාවකයන් සද්ධර්මාලංකාරය වටා එක්රොක් වෙති.'' නිර්දිෂ්ට කථා වස්තු ආශ්‍රයෙන් මේ ප්‍රකාශය පැහැදිලි කරන්න.

<u>නැතහොත්</u>

''ශ්‍රාවක අවධානය යොමු කිරීම සඳහා සරල භාෂාව මෙන් ම වර්ණනාත්මක භාෂා ව්‍යවහාරය යොදා ගැනීමට පූජාවලි කතුවරයා භාවිත කළ උපක්‍රමයකි'' නිර්දිෂ්ට කථා ඇසුරෙන් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

(04) ගුත්තිල කතු හිමි ගුත්තිල කාව්‍ය රචනයෙහි පුද්ගල මනෝභාවයන් විශ්වසනීයත්වයෙන් විවරණය කළ අයුරු, ගුත්තිල ඇඳුරු හා මූසිලගේ චරිත ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 15)

(05) බැද්දේගම නවකතාවෙන් ගැමියන්ගේ දුක්ඛිත ස්වභාවයන් අනාවරණය කරන මුත් පාඨකයාට සෞන්දර්යාත්මක අත්දැකීමක් ලබා දීමට කතුවරයා උපක්‍රමශීලී වී ඇත'' පහදන්න. (ලකුණු 15)

(06) කෙටිකතාවක අන්තර්ගත විය යුතු මූලික ලක්ෂණ අතුරෙන් තුනක්වත් උපයෝගී කරගෙන '' කවියකුට අත්දැකීමක්'' කෙටිකතාව ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(07) නූතන කවියා කාව්‍ය රචනයේ දී සම්ප්‍රදායන්ට වහල් නොවී නිදහස් කාව්‍ය සම්ප්‍රදායක් අනුගමනය කළ අයුරු නිර්දිෂ්ට පද්‍ය පන්ති තුනක්වත් ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 15)

(08) ''ස්වර්ණතිලකයන් චරිතය තුළින් මානුෂීය ලක්ෂණ පිළිබිඹු වේ'' මෙම කියමන නාට්‍ය පෙළ ඇසුරෙන් සනිදර්ශිතව පහදන්න. (ලකුණු 15)

සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved



# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# Provincial Department of Education - NWP

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education - NWP

තෙවන වාර පරීක්ෂණය - 13 ශ්‍රේණිය - 2023
Third Term Test - Grade 13 - 2023

## සිංහල - II

කාලය පැය 03 යි
අමතර කාලය වි. 10යි

- I කොටසේ පළමුවන ප්‍රශ්නය ද, II කොටසේ 2, 3 ප්‍රශ්න ද ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.
- පළමු ප්‍රශ්නයේ ඇති සියලු ම අනුකොටස්වලට මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- I කොටස II කොටසේ පිළිතුරු පත් සමඟ අමුණා භාර දෙන්න.

## I කොටස

- එක් එක් ප්‍රශ්නයට වඩාත් ම ගැළපෙන පිළිතුර තෝරාගෙන එයට හිමි අංකය වරහන් තුළ ලියන්න.

(01) (1.1) 'රස' යන්නෙහි අන්තර්ගත ව්‍යඤ්ජනවල උත්පත්ති ස්ථානය වනුයේ,

(1) ඕෂ්ඨජ හා තාලුජ (2) කණ්ඨජ හා දන්තජ (3) මූර්ධජ හා දන්තජ
(4) මූර්ධජ හා කණ්ඨජ (5) දන්තජ හා තාලුජ (..........)

(1.2) නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත පද පේළිය තෝරන්න.

(1) පරිඝණකය , ලේඛනය , ශීඝ්‍රගාමී , පරිවර්තනය
(2) පරිගනකය , ලේඛනය , ශීග්‍රගාමී , පරිවර්ථනය
(3) පරිඝණකය , ලේඛණය, සීග්‍රගාමී , පරිවර්තනය
(4) පරිගණකය , ලේඛනය , සීග්‍රගාමී , පරිවර්තනය
(5) පරිගණකය , ලේඛනය , ශීඝ්‍රගාමී , පරිවර්තනය (..........)

(1.3) අකාරාදී පිළිවෙළ අනුව නිවැරදි ව ලියා ඇති පද පේළිය තෝරන්න.

(1) වෙස්සන්තර , තලමලපිපිලා , හුණුවටය , මධුජවනිකා
(2) මධුජවනිකා , වෙස්සන්තර , හුණුවටය , තලමලපිපිලා
(3) හුණුවටය , තලමලපිපිලා , මධුජවනිකා , වෙස්සන්තර
(4) තලමලපිපිලා , මධුජවනිකා , වෙස්සන්තර , හුණුවටය
(5) මධුජවනිකා , වෙස්සන්තර , තලමලපිපිලා , හුණුවටය (..........)

(1.4) පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) යංශය හා 'ය' කාරය වචනයක එක ළඟ නො යෙදේ.
(2) යංශය 'ය' කාරය නියෝජක සංකේතයකි.
(3) වචනයක ඕනෑම පරිසරයක හල් ස්වරූපයක 'ය' කාරය වෙනුවට යංශය යෙදිය හැකිය.
(4) ව්‍යඤ්ජනයකට යංශය සංයුක්ත වීමේ දී ව්‍යඤ්ජනයේ හල් ස්වරූපය ඉවත් නොවේ.
(5) යංශය සමඟ රේඵය යෙදිය නොහැකි ය. (..........)

(1.5) එකිනෙකට අනුරූප වන සේ වචන යුගලය යෙදී ඇති වරණය තෝරන්න.

(1) මාතෘ භාෂාව , බක්මහ උලෙළ , කනිටු විදුහල , කතු වැකිය
(2) මහාප්‍රාණ අකුරු , නගර සභාව , වෙද නිලධාරි , හිරු මඬල
(3) විදසුන් භාවනා , මරණීය දණ්ඩනය , සඤ්ඤක අක්ෂර , සුබ ප්‍රාර්ථනා
(4) තෑගි ප්‍රදානය , විදෙස් ප්‍රවෘත්ති , වාර්ශික වාර්තා , විෂය කරුණු
(5) වෙළෙඳ මණ්ඩලය , දළදා මන්දිරය , ධාරානිපාත වර්ෂාව , ශිලා ලිපිය (..........)

(1.6) තත්සම පද පමණක් අන්තර්ගත වරණය කුමක් ද?

(1) හිස , කඳ , පය , නළල

(2) මන්දිර , නිදසුන් , නිර්මල , උත්සව

(3) වාණිජ්‍ය , වජ්‍ර , නගර , නර

(4) සිරුරු , සිහින , සිංහ , ව්‍යාඝ්‍ර

(5) සාධ්‍ය , සංවර , කලණ , සිරස (..........)

(1.7) තද්භව වචන පමණක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) බෝසත් , සහස්‍ර , පියුම , දිවයුරු

(2) මධුර , උත්තම, නිදොස් , පියවි

(3) ඉඳුවර , මාණික්‍ය , අතවැසි , සුරිඳු

(4) අප්‍රමාණ , මැතිඳු , මනහර , දුර්ජන

(5) විසිතුරු , සිතියම් , වළාකුළු , සේසත් (..........)

(1.8) විභක්ති , අව්‍යය , විශේෂණ , අන්‍යාර්ථ යන සමාස පද අනුපිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(1) මින්දද , දියබත් , තිසරණ , අවගුණ

(2) අවගුණ , මින්දද , දියබත් , තිසරණ

(3) තිසරණ , අවගුණ , මින්දද , දියබත්

(4) දියබත් , අවගුණ , තිසරණ , මින්දද

(5) දියබත් , මින්දද , අවගුණ , තිසරණ (..........)

(1.9) කෘදන්තයක් නො වන පදයක් අන්තර්ගත වර්ණය තෝරන්න.

(1) සැලෙනා , දැවෙනා , නයනා , වයනා

(2) වසුළ , අතුළ , මතුළ , වගුළ

(3) දුවන , දවන , දෙන , දොවන

(4) සැලසුම් , දිවිරුම් , සැරසුම් , පැවරුම්

(5) යැදුමන් , පැතුමන් , ලියමන් , හිඟමන් (..........)

(1.10) පහත දැක්වෙන උද්ධෘතවල තද **කළු අකුරින් මුද්‍රිත** පද අයත් ක්‍රියා වර්ගය පිළිවෙළින් දක්වා ඇති වරණය තෝරන්න.

(අ) ''රජුට දිය වැඩ මඟුල් **වේවා**''

(ආ) ''**සූරලා** ගෙන යන්න මා හදේ පිපුණා මල්''

(ඉ) ''හෙල ගැඹුරුයි පුත, **නොබලන්**''

(ඊ) ''**කියමින්** නම'කුරු ඔබගේ''

(1) ආශිර්වාද ක්‍රියා , පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , විධි ක්‍රියා

(2) ආශිර්වාද ක්‍රියා , පූර්ව ක්‍රියා , විධි ක්‍රියා , මිශ්‍ර ක්‍රියා

(3) පූර්ව ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , විධි ක්‍රියා , ආශිර්වාද ක්‍රියා

(4) ආශිර්වාද ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , පූර්ව ක්‍රියා , විධි ක්‍රියා

(5) ආශිර්වාද ක්‍රියා , විධි ක්‍රියා , මිශ්‍ර ක්‍රියා , පූර්ව ක්‍රියා (..........)

(1.11) තද්ධිතයක් නො වන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

(1) නානත්ව , බුද්ධත්ව , සනත්ව , විවිධත්ව

(2) ධීමත් , ශ්‍රීමත් , මනමත් , රූමත්

(3) පාලිකා , බාලිකා , ශාලිකා , නාළිකා

(4) මැඳිරි , සැතිරි , වැඳිරි , ඇඳිරි

(5) ප්‍රාසංගික,නාගරික,පෞරාණික , දෛනික (..........)

(1.12) උපසර්ගයක් යෙදී නො මැති වචනයක් සහිත වරණය තෝරන්න.

(1) සපිරිකර , සාතිශය , සානුකම්පා , සමලංකෘත

(2) වියුක්ත, විරහිත, විරචිත, විගමන

(3) ආරෝහණ , ආයාචන, ආරම්භ, ආනයන

(4) ප්‍රතිවීන, ප්‍රතිපක්ෂ , ප්‍රතිව්‍යුහ , ප්‍රතිරෝධ

(5) උපැස් , උපත , උදාන , උපවන (..........)

(1.13) නිපාතයක් නො වන පදයක් සහිත වරණය තෝරන්න.

(1) අයුරු , සදිසි , බඳු, වැනි

(2) පමණ , තරම් , විතර , බොහෝ

(3) විනා , මිස , මුත් , හැර

(4) අහෝ , අපොයි , චිචී , ඔහෝ

(5) අන්න, ඔන්න, එන්න, මෙන්න (..........)

(1.14) ''ග්‍රන්ථ **නාමාවලියේ** සඳහන් පතපොත **පරිශීලනය** කිරීම **ප්‍රයෝජනවත්** ය.'' යන වාක්‍යයෙහි වචන යෙදී ඇති පිළිවෙළ අනුව **තද කළු අකුරින්** ඇති පද අයත් වන්නේ කුමන ව්‍යාකරණ අංගවලට ද?

(1) සන්ධි , තද්ධිත, උපසර්ග (2) සන්ධි , උපසර්ග, තද්ධිත

(3) උපසර්ග , තද්ධිත, සන්ධි (4) තද්ධිත, උපසර්ග, සන්ධි

(5) තද්ධිත, සන්ධි, අපසර්ග (..........)

(1.15) සමාන ව්‍යාකරණ ලක්ෂණ ඇතුළත් නො වන ක්‍රියා රූප සහිත වරණය තෝරන්න.

(1) කැඩූ, හැඬූ, සෑදූ, වැඩූ

(2) කරමින්, නටමින්, යමින්, සාමින්

(3) කරවයි ,නාවයි , දුවයි , ලියවයි

(4) ගොස්, බලා , අවුත් , විද

(5) යන්නී , එන්නී, රඟන්නී, මවන්නී (..........)

(1.16) සමාසයක් නොවන වචනයක් ඇතුළත් වරණය තෝරන්න.

(1) රිවිකිරණ, තරුඑළිය, සඳපාන, සැඳෑඅඳුර

(2) නළුනිළි, ගුරුගෙදර, ගොවිකම්කරු, බඹසුර

(3) කහකුරුල්ලා, අලුකොබෙයියා, වලිකුකුළා, වදමල

(4) සන්තෝෂ, සන්දේශ, සම්බාධ, සන්නාලි

(5) සහස්රැස්, සුන්බත්, සරණවි, තිසුලවි (..........)

(1.17) එක ම වර්ගයට අයත් සන්ධි පද ඇතුළත් වරණය තෝරන්න.

(1) අවස්ථෝචිත, ඍද්මානුකූල, මහාමාත්‍ය, ගුරූපදේශ

(2) තුනුරුවන්, වළංකඳ, තම්පලා, මිහින්තල

(3) රම්මුතු, කම්මුල, මංමුළා, ඇද්දළ

(4) කොස්සැට, පත්තිරු, වල්ලූරා, සිවුරඟ

(5) සැරියුත්, පන්සිල්, බුත්සරණ, පිරියම් (..........)

(1.18) ව්‍යාකරණානුකූල ව නො ගැළපෙන වරණය කුමක් ද?

(1) තිරරෙදි, සිවුරුපිළි, ශිෂ්‍යාධාර, ගුරුපඬුරු

(2) අදරැති, ගිරග, කෙසරිඳු, කඳුළැලි

(3) පුණ්‍යවන්ත, ශීලවන්ත, ස්නේහවන්ත, කරුණාවන්ත

(4) කෘත, මෘත, ශ්‍රැත, වත

(5) කු , දු , සු , අති (..........)

(1.19) ව්‍යාකරණානුකූල ව නිරවද්‍ය වාක්‍ය තෝරන්න.

(1) අප සමඟි වන්නේ කවදා ද?

(2) දස දෙනෙකු ආයතනයෙන් ඉවත් වෙති.

(3) රංගනයෙහි යෙදෙන්නේ නළුවෝ ය.

(4) එක් අයෙක් හුදෙකලාව වාසය කරති.

(5) අපි හොඳින් ඉගෙන ගතහොත් ගුරුවරු ප්‍රශංසා කරති. (..........)

(1.20) ලේඛන ව්‍යවහාරයට අනුකූල වාක්‍යය සහිත වරණය තෝරන්න.

(1) අවුරුදු නැකතට ම වැඩ අල්ලමු.

(2) ජනාධිපතිවරයා නව ඇමතිවරුන් දස දෙනෙකු පත් කළේය.

(3) මර්දනයට එරෙහි ව හැම දෙනා ම එක්වෙන්නට ඕනෑ.

(4) ඒ ගැන අමුතුවෙන් මොනවා කියන්න ද?

(5) දැන් ඉතින් අහං ඉඳපල්ලා. (..........)

(ල. 20 යි)

(02) (අ) පහත සඳහන් පාඨය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ක්‍රි.පූ. පළමුවන සියවස ලක්දිව බෞද්ධ ශාසන ඉතිහාසයේ පරිවර්තනාත්මක අවධියක් වූ බවට සාධක තිබේ. එම ශතවර්ෂයේ අවසාන භාගයේ දී සංඝයා අතර පළමුවෙනි නිකාය භේදය ඇති විය. වට්ටගාමිණී අභය රජු අභයගිරි විහාරය කරවා තමාට හිතවත් වූ මහාතිස්ස තෙරුන්ට පිදූ ආකාරයත් අභයගිරි වාසීන් ථෙරවාදයෙන් ඉවත් වී ගිය ආකාරයත් සවිස්තර ව මහාවංශයෙහි කියැවේ. මහදැළියාතිස්ස නම් භික්ෂුව දඹදිව වජ්ජිපුත්‍රක නිකායට අයත් ධම්මරුචි නිකායේ ඉගැන්වීම් පිළිගත් තැන් සිට අභයගිරිවාසී සංඝයා ධම්මරුචි නිකාය නමින් හැඳින්වුණු බැව් නිකාය සංග්‍රහයෙහි සඳහන් වේ.

මෙතැන් සිට ශතවර්ෂ තුනක් පමණ කාලය තුළ පැවති කිසිම අන්‍යවාදී නිකායක් ගැන මහාවංශය සඳහන් නොකරයි. මේ කාලයෙහි පැවති තත්ත්වය සැහෙන ප්‍රමාණයකින් විදහාපාන එක් පාඨයක් සමන්ත පාසාදිකාවෙහි තිබේ. එහි දැක්වෙන සැටියට භාතිය රජුගේ රාජ්‍ය සමයෙහි දී විනය ශික්ෂා පදයක් පිළිබඳ ව අභයගිරිවාසී භික්ෂූන් සහ මහාවිහාරවාසී භික්ෂූන් අතර මතභේදයක් ඇති වූයේ ය. මේ මතභේදය ගැන රජතුමාට සැළ වූයෙන් ඔහු එය නිරාකරණය කිරීම පිණිස පණ්ඩිත වූ ද වෙනත් භාෂාවන්හි දක්ෂ වූ ද දීඝකාරායන නම් අමාත්‍යයා පත් කළේ ය. මේ මතභේදය විසඳීමට පත් කරන ලද පුද්ගලයා ධර්මය ගැන විශාරදත්වයක් ඇති භික්ෂුවක් නොව භාෂාන්තරයන්හි දක්ෂතාවක් ඇති ගිහියෙකි. එබැවින් විහාරද්වයවාසී භික්ෂූන් අතර හටගත් මේ මතභේදයට නිමිති වූයේ ධර්මමය කරුණකට වඩා භාෂාමය කරුණකැ'යි අපට අනුමිති වශයෙන් සිතාගත හැකි ය. අභයගිරිනිකාය බොහෝදුරට මහායානයෙන් අභාසය ලද්දකි. එහි ත්‍රිපිටකය ආයේ ද පාලියෙන් නොව සංස්කෘතයෙනි. ඇතැම් විට මේ මතභේදය පැන නැගුණු කාලයෙහි පවා අභයගිරිවාසීන් සංස්කෘත ත්‍රිපිටකය භාවිත කරන්නට ඇත. සංස්කෘතයෙහි ප්‍රවීණයකු වූහ' යි සිතිය හැකි අමාත්‍යයෙකු පත්කිරීම ද මේ අනුමිතිය තහවුරු කරන්නකි.

(i) අභයගිරිවාසී භික්ෂූන් හා මහා විහාරාසී භික්ෂූන් අතර මතභේදයක් හටගත්තේ කුමක් පිළිබඳව ද?

(ii) අභයගිරිවාසී සංඝයා ධම්මරුචි නිකාය නමින් හැඳින්වීමට හේතුව කුමක් ද?

(iii) මහායානිකයින්ගේ ත්‍රිපිටකය ලියැ වී තිබුණේ කවර භාෂාවකින් ද?

(iv) ශාසන ඉතිහාසය පිළිබඳ කරුණු ඇතුළත් , මෙහි නම් සඳහන් ග්‍රන්ථ මොනවා ද?

(v) භික්ෂූන් දෙපිරිස අතර ඇති වූ මතභේදය භාෂා ප්‍රශ්නයක් යැ' යි ලේඛකයා අනුමාන කරන්නේ ඇයි?

(vi) අභයගිරිවාසී භික්ෂූන් සහ මහාවිහාරවාසී භික්ෂූන් පිළිගත් බෞද්ධ සම්ප්‍රදායන් වෙන වෙන ම සඳහන් කරන්න.

(ල.2 x 6 = 12)

(ආ) පහත දැක්වෙන උද්ධෘතය කියවා එහි වචන සංඛ්‍යාව තුනෙන් එකක් වන සේ සාරාංශ කොට ලියා සාරාංශය අග, වචන සංඛ්‍යාව ද සඳහන් කරන්න.

විසි වැනි සියවසෙහි පහළ වූ නාට්‍යකරුවන් අතුරින් ජර්මන් ජාතික බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් තරම් විචාරකයන්ගේ අවධානයට ලක් වූ අන් නාට්‍යකරුවෙකු නැතැ'යි පැවසීම අතිශයෝක්තියක් නොවේ.බොහෝ තතු දත් විචාරකයෝ ඔහු වර්තමාන අවධියට අයත් අග්‍රගණ්‍ය නාට්‍යකරුවා වශයෙන් සලකති. බ්‍රෙෂ්ට්ගේ කෘති නිර්දය ලෙස විවේචනය කරන්නන් පවා ඔහු ස්වාධීන නිර්මාණාත්මක බුද්ධියකින් හෙබි කලාකරුවකු ලෙස පිළිගන්නා බව පෙනේ. වර්ෂ 1889 උපත ලැබූ ඔහු වර්ෂ 1956 මිය ගියේ ය. විස්සකට අධික සංඛ්‍යාවක් නාට්‍ය බ්‍රෙෂ්ට් රචනා කළ අතර, ඔහුගේ 'මදර් කරේජ්' , 'ලයිෆ් ඔෆ් ගැලීලියෝ' , 'ද කොකේසියන් චෝක් සර්කල්', 'ගුඩ් වුමන් ඔෆ් සෙට්ෂුවාන් ' වැනි නාට්‍ය විශ්ව සම්භාවනාවට පාත්‍ර ව ඇත. මින් 'ද කොකේසියන් චෝක් සර්කල්' 'හුණුවටයේ කථාව' යනුවෙනුත් 'ගුඩ් වුමන් ඔෆ් සෙට්ෂුවාන් ' 'හිත හොඳ අම්මණ්ඩි' යනුවෙනුත් සිංහලයට පරිවර්තනය කොට නිෂ්පාදනය කරන ලදී. හෙන්රි ජයසේන, දයානන්ද ගුණවර්ධන

වැනි නාට්‍ය කරුවන්ගේ ස්වාධීන කෘති කෙරෙහි ද බෙර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ රංග ශෛලිය බල පා ඇති බව සමහරු පවසත්.

මෙය පුදුමයට කරුණක් නොවේ. නාට්‍ය කලාව අරබයා බ්‍රෙෂ්ට් නැගූ මතවාද හා ඔහුගේ රංග ශිල්පය අපරදිග නාට්‍ය ලෝකයේ ප්‍රබල විප්ලවයක් ඇති කිරීමට හේතුභූත විය. උදාහරණයක් වශයෙන් නූතන බ්‍රිතාන්‍ය නාට්‍ය ක්ෂේත්‍රය දෙස බලන විට, තරුණ ආධුනික නාට්‍ය රචකයන් හා නිෂ්පාදකයන් අතුරින් බහුතර සංඛ්‍යාව කිසියම් ආකාරයකින් බ්‍රෙෂ්ට්ගේ බලපෑමට හසුව ඇති බව පෙනේ. ආධුනික නාට්‍යකරුවන් පමණක් නොව ජොන් ඔස්බෝර්න් වැනි කීර්තිමත් නාට්‍යකරුවන් හා කෙනත් ටයිනන් වැනි සූක්ෂ්මදර්ශී විචාරකයින් බෙර්ටෝල්ට් බ්‍රෙෂ්ට්ගේ මතවාදයන්ට බෙහෙවින් ණයගැති බව කිව හැකිය. (ලකුණු 13)

03) දී ඇති මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 300 - 350 ට අතර වන සේ විශ්ලේෂණාත්මක රචනාවක් ව්‍යාකරණානුකූලව ලියන්න.

(i) දේශීය නිෂ්පාදන ආර්ථිකයක අවශ්‍යතාවය.

(ii) රටක දේශපාලන අස්ථාවරත්වය සංවර්ධනයට බලපාන ආකාරය.

(iii) දිනෙන් දින ඉහළ යන අපරාධ වළක්වා ගැනීමට ගත යුතු පියවර.

(iv) රසකාරක යෙදූ ක්ෂණික ආහාර භාවිතය බෝ නොවන රෝග වැඩි වීමට හේතුවකි.

(v) කායික මානසික නිරෝගී බව සඳහා ක්‍රීඩාවේ ඇති බලපෑම. (ලකුණු 25)

(04) (අ) පහත සඳහන් වාක්‍යවල සදොස් තැන් ඇතොත් නිදොස් කොට ලියන්න.

(i) දේශපාලකයෝ රට උගසට තබති'යි ඇතැම්හු කියති.

(ii) ශිෂ්‍යයෝ බොහෝ දෙනෙකු ගුරුවරුන් අගය කරති.

(iii) සැකකරුවෝ නිදහසට කරුණු දක්වන ලදහ.

(iv) මෙය ගැබිනි මාතාවන් සඳහා වෙන් කරන ලද අසුනකි.

(v) මිහිඳු මා හිමි දඹදිව සිට ලක්දිවට වැඩම කළේ ය.. (ලකුණු 1 × 5 = 05)

(ආ) පහත සඳහන් වාක්‍ය කර්ම කාරකයට හරවන්න.

(i) අපේක්ෂකයෝ ඇප මුදල් තැම්පත් කළහ.

(ii) ඇතැම්හු වාණිජ පරමාර්ථයෙන් වෘක්ෂලතාවන් විනාශ කරති.

(iii) වඳුරෝ බළලුන් ලවා කොස් ඇට බාවති.

(iv) ඉන්දියානුවෝ චන්ද්‍රයාන් - 3 සඳමතට පතිත කරවූහ.

(v) ආණ්ඩුකාරවරයා ප්‍රධාන අමාත්‍යාංශයට ලේකම්වරියක පත් කළේ ය.

(ලකුණු 1 × 5 = 05)

(ඉ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පද වරහන් තුළින් තෝරන්න.

(i) (ඕ තොමෝ/ ඕ තුමූ) වෙහෙරට මල් පූජා (කළා ය / කළෝ ය)

(ii) (ගායකගායිකාවන් /ගායකගායිකාවෝ) බොහෝ (දෙනෙක්/දෙනෙකු) වේදිකාවේ ගී ගැයූ හ.

(iii) වැඩ වැරූ සෞඛ්‍ය (සේවකයන් /සේවකයෝ) සමඟ සාකච්ඡා කිරීමට (බලධාරීන්/බලධාරීහු) එකඟ වූහ.

(iv) විදුහල්පතිතුමා ශිෂ්‍යයන් (දෙදෙනෙක් / දෙදෙනෙකු) කාර්යාලයට (කැඳවූහ / කැඳවීය).

(v) භික්ෂූන් (වහන්සේ / වහන්සේලා) පිඬු පිණිස ගෙපිළිවෙළින් (වඩියි / වඩිති)

(ලකුණු 1 × 5 = 05)

(05) (අ) පහත දැක්වෙන වාක්‍යවල **තද කළු අකුරින්** මුද්‍රිත පදවල ව්‍යාකරණ අංගය දක්වා ඇත. ඒවායෙහි අනු අංගය දක්වන්න.

(i) **සමෘද්ධිමත්** දේශයක් **ගොඩනගනු වස් ලක්වැසියන්** එක් විය යුතු ය.
(සමෘද්ධිමත් - තද්ධිත , ගොඩනගනු වස් - ක්‍රියා, ලක්වැසියන් - විභක්ති)

(ii) **වනවාසී** භික්ෂූන් වහන්සේ **ජනතාවගේ ගෞරවාදරයට** පාත්‍ර වූහ.
(වනවාසී - සමාස , ජනතාවගේ - විභක්ති , ගෞරවාදරයට සන්ධි)

(iii) හෙලන නගන අත **නුවනග බැලුම් දිදී**
**(නුවනග - සන්ධි , බැලුම් - කෘදන්ත , දිදී - ක්‍රියා)**

(iv) ලෝකයේ **පානීය** ජලය අතිශයින් ම **දුර්ලභ ය.**
(පානීය - කෘදන්ත , දුර්ලභ - උපසර්ග , ය - නිපාත)

(v) දේශපාලනඥයින් **විසින් ජනතාව නිරතුරු** රවටෙති.
**(විසින් - නිපාත , ජනතාව - තද්ධිත , නිරතුරු - සන්ධි)**

(ලකුණු ½ × 6 = 03)

06 (අ) පහත දැක්වෙන වාක්‍යවල හිස් තැනට වඩාත් ම ගැළපෙන පදය වරහන් තුළ දී ඇති පද අතුරෙන් තෝරා ලියන්න.

(i) බුදුරදුන් වැඩ සිටි ......................................................කුටියට අනඳ හිමියෝ වැඩම කළ හ.

(ii) ............................................ ද්‍රව්‍යවල මිල දිනෙන් දින ඉහළ යයි.

(iii) සාලිය - අශෝකමාලා .................................. වෘත්තාන්තය ඉතිහාසයේ ලියැවී තිබේ.

(iv) සිරි මා බෝ සමිඳුට කිරි ....................................... පූජාව සෑම දිනක ම උදෑසන සිදු කෙරෙයි.

(v) මේ ...................................... දුම් තෙරුවනට පූජා වේවා !

(vi) ඔවුන්ගේ සොයුරු ................................ සසර පුරා පැවත එන්නකි.

(සුවඳ / පෙම / අහර / ප්‍රේම / ආහාර / සුගන්ධ) (ලකුණු ½ × 6 = 03)

(ආ) පහත සඳහන් වාක්‍ය වර්තමාන ලේඛන ව්‍යවහාරයෙන් ලියන්න.

මේ දවස්වල තියෙන දැඩි නියඟය හින්දා ඉවසන්නට බැරි උෂ්ණයක් දැනෙයි.

(ලකුණු ½ × 6 = 03)

(ඉ) **තද කළු අකුරින්** මුද්‍රිත පදවල විභක්ති නම් කරන්න.

(i) **ජනතාවට** සහන සැලසීම **රජයේ** වගකීමකි.

(ii) ඇය **දෙවඟනක** සේ **රූපයෙන්** බබළයි.

(iii) **ළදරුවා තොටිල්ලෙහි** සුවසේ නිදයි.

(ලකුණු ½ × 6 = 03)

(ඊ) අවශ්‍ය තැන්වල විරාම ලක්ෂණ යොදා පහත දැක්වෙන කොටස නැවත ලියන්න.

ප්‍රදේශවාසී තරුණතරුණියනි තරුණ අරුණ වැඩසටහන ජූලි මස 9 වන දින ප.ව. 2.00 6.00 දක්වා වස්ගමුව සුදර්ශන ශාලාවේ දී පැවැත්වේ. (ලකුණු ½ × 6 = 03)

(උ) පහත දැක්වෙන ප්‍රකාශවල එක් එක් ප්‍රකෘති කථනය විකෘති කථනයට හරවා ලියන්න.

(i) ''මම මෙවර ඔබට සමාව දෙනවා'' යි රුවන් පැවසුවේ ය.

(ii) ''ඊයේ ඔබ සිටියේ කොහිදැ'' යි පොලිසිය අමල්ගෙන් විමසී ය.

(iii) ''මේ තත්ත්වය මත ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව රට හැර යාවි'' යි මහාචාර්යවරයා කීවේ ය.

(ලකුණු ½ × 6 = 03)

(07) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ඉක්බිති **අනුලාදේවී** පන්සියයක් බිසෝවරුන් ද, පන්සියයක් පුරස්ත්‍රීන් ද, සමඟ **සම්මිත්ත** තෙරණින් වහන්සේ සමීපයෙහි මහණ ව නොබෝ දවසෙකින් පිරිවර හා රහත් වූ සේක. තවද, රජ්ජුරුවන්ගේ **අරිට්ඨ** නම් බෑයණුවෝ ද පන්සියයක් රාජපුරුෂයන් සමඟ **මිහිඳු** මහතෙරුන් වහන්සේ සමීපයෙහි මහණ ව, නොබෝ දවසෙකින් රහත් වූ සේක. එක් දවසක් රජ්ජුරුවෝ තෙරුන් වහන්සේ සමඟ බෝධීන් වහන්සේ වැඳ **ථූපාරාමයට** යන්නෝ **ලෝවාමහාපාය** කරවන සමීපයට පැමිණිය හ. මෙසේ පැමිණි රජ්ජුරුවන්ට රාජපුරුෂයෝ **සපුමල්** ගෙන හැර දුන්හ.

(i) ඡේදයේ කළු අකුරින් මුද්‍රිත පද අකාරාදී පිළිවෙළට ලියා දක්වන්න.

(ii) රජ්ජුරුවෝ, තෙරණින්,සැලී යන වචනවල යෙදී ඇති පිලි වෙන වෙන ම ලියන්න.

(iii) නිපාත පද තුනක් ඡේදයෙන් උපුටා දක්වන්න.

(iv) ගාත්‍රාක්ෂර ලෝප, ගාත්‍රාදේශ, ආගම යන සන්ධිවලට අයත් සන්ධි පදය බැගින් ඡේදයෙන් උපුටා ලියන්න.

(v) වචනයේ මුලට කණ්ඨජ අක්ෂරයක් හා පිළිවෙළින් මූර්ධජ අක්ෂර තුනක් යෙදුණු වචනයක් ලියන්න. (ල. 3× 5 = 15)

(08) පහත සඳහන් මාතෘකාවලින් තුනක් තෝරා ගෙන කෙටි සටහන් ලියන්න.

1 අඝෝෂාක්ෂර

2 පර රූප සන්ධිය

3 ප්‍රයෝජ්‍ය ක්‍රියා

4 විභක්ති සමාසය

5 මුවා, මය තද්ධිත ප්‍රත්‍යය (ල. 15)

(01) (අ) (i) බුදු හිමිට නොවැද සතුටු සාමීචි කථාවන්හි ද නොයෙදෙමින් එක් අත් පසෙකට වී සිටිමින්.
(ii) නැකැත් තාරකා පිරිවරාගෙන නික්මුණා වූ සඳ සේ.
(iii) යුගාන්ධර පර්වත මස්තකයෙහි බබළන්නා වූ මණ්ඩලාකාර ළා හිරු පරිද්දෙන් බුදු හිමි අසුනෙහි සිටියේ ය.
(iv) ගෞතමයන් වහන්සේ / ගෝතම ගෝත්‍රයට අයත් වූ හෙයින් ගොයුම්හු නම් යෙදේ.

(ආ) (i) බොහෝ මානය ඇති බව / තමා පිළිබඳ තමා ම ඉහළින් සිතීම.
(ii) උපාලි කපුවා පළමුව පැවිදි භාවයට පත් කරන ලෙස.
(iii) ''එසේ කල්හි අප තුළ ඇති ආඩම්බර හැඟීම නැති වෙයි පැවිදි පිළිවෙත සම්පූර්ණ වන්නේ ය.
(iv) කරණවැමියා / දැළි රැවුළු කපන්නා (ලකුණු 1 × 4 = 4)

(ඉ) (i) සිය මහබෝසතාණෝ (කිඳුරා) සිඹ ඔසවාගෙන පර්වත මුදුනට ගෙනගොස් (කිඳුරාගේ) බෝසතාණන්ගේ හිස තම ඔඩොක්කුවෙහි තබාගෙන විලාප නගමින් දුක් වීම.
(ii) පෙර ඔහු ප්‍රේමණීයත්වයෙන්, පරිසර අසිරිය විඳිමින් ගත කළ දිවිය හේතුවෙන්.
(iii) ''තව ද ස්වාමීණී, මල් ගෙඩි දලු වලින් අලංකාර වූ ලොකු කුඩා වනාන්තර ....
(iv) බලාපොරොත්තු නොමැති ව. (ලකුණු 1 × 4 = 4)

(ඊ) (i) දරුණු , නොහික්මුණු අමනුස්ස පිරිස්
(ii) සංසරත්නය (භික්ෂූන් වහන්සේ ලා)
(iii) ''සරණ යාමේ අනුහසේ මහත් බව පුදුම සහගතය''
(iv) කුසලා කුසල කර්ම නැමැති මරුවා (ලකුණු 1 × 4 = 4)

(උ) (i) කලාවෙන් සම්පූර්ණ වූ සඳක (සොලොස් කලාවෙහි පිරුණු පුන් සඳක)
(ii) සරත් කාලයේ උදැසන සූර්යා විලසින්
(iii) ''බබළන දීප්තිමත් මුතු මාලය''
(iv) බැබළෙන සුදු කුඩ (ලකුණු 1 × 4 = 4)

(ඌ) (i) ලෙනාඩ් වුල්ෆ් විසින් 'ද විලේජ් ඉන් ද ජන්ගල්' කෘතිය ඒ.පී. ගුණරත්නයන් විසින් සිංහලයට නගන ලද බැද්දේගම නවකතාවෙහි එන පාඨයකි. ආරච්චි හා ප්‍රනාන්දු මුදලාලී සිලිදු විසින් මරා දමන ලද බව දැනගන්නා පුංචි මැණිකා විසින් සිලිඳුගෙන් අසන ලද පැනයකි.
(ii) එදිරිවීර සරච්චන්ද්‍රයන් විසින් රචනා කරන ලද ''පේමතෝ ජායතී සෝකෝ'' නාට්‍යයෙන් උපුටා ගත් පාඨයකි. උද්දාල බමුණා ශිල්ප ශාලාවට නොපැමිණීම පිළිබඳ උරණව අවට ගැවසෙන සිසුන් පිළිබඳ සැක උපදවන ස්වර්ණතිලකා විසින් උද්දාල බමුණා අමතා කරන ලද ප්‍රකාශයකි.
(iii) සයිමන් නවගත්තේගමයන් විසින් රචිත 'ස්නේහය' කෙටි කතාවේ එන පාඨයකි. පිංචිමහියියා නිවසේ නැති අතරේ රංකිරා උන්දෑ පාරට පැමිණි අවස්ථාවේ මීයැල්ලෑවේ කළු දුගියා උන්දෑ විසින් රංකිරා උන්දෑගෙන් අසන ලද්දකි.
(iv) දඹදෙණි අවධි මයුරපාද පරිවේණාධිපති බුද්ධ පුත්‍ර හිමියන් විසින් ලියන ලද පූජාවලියේ ජීවක වෛද්‍යවරයාගේ කථාවේ එන පාඨයකි. භගන්දරාබාධයෙන් පීඩාවට පත් වී සිටි බිම්බිසාර රජු දක්ෂ වෛද්‍යවරයකු පිළිබඳ අභයරාජකුමාරයාගෙන් විමසූ විට අභය රාජකුමරු ජීවක පිළිබඳ බිම්බිසාර රජුට පවසන ලද්දකි.
(v) දඹදෙණි යුගයේ ධර්මසේන හිමියන් විසින් රචිත සද්ධර්මරත්නාවලියේ මට්ටකුණ්ඩලී වස්තුවෙහි එන පාඨයකි. මට්ටකුණ්ඩලී කුමරාට පිහිට වීම සඳහා බුදුහිමියන් වැඩම කළ අවස්ථාවේ බුදුහිමියන් දැක අසරණව සිටි මට්ටකුණ්ඩලී විසින් සිතන ලද්දකි.
(vi) කුරුණෑගල සමයේ බහු කර්තෘත්වයක් විසින් රචිත පන්සිය පනස් ජාතක පොතේ චුල්ල ධනුද්ධර ජාතකයේ එන පාඨයකි. චුල්ල ධනුද්ධරයන්ගේ මරණයෙන් පසු සොර දෙටුවා හා ස්ත්‍රිය ගඟ සමීපයට පිමිණි අවස්ථාවේ සොර දෙටුවා විසින් සිතන ලද සිතිවිල්ලකි.
(vii) ගම්පොළ යුගයේ දෙවන ධර්මකීර්ති හිමියන් විසින් රචිත සද්ධර්මාලංකාරයේ නන්දි වාණිජ වස්තුවෙහි එන පාඨයකි. සිව අමාත්‍යයා මාවටු පටුන්ගමට පැමිණ නුවර පැදකුණු කරන අතරතුර නන්දිය බිරිඳ දැකීමෙන් විකල්බවට පැමිණ, සිහි එළවා ගත් පසු පිරිවර සෙනඟ අමතා සිව අමාත්‍යයා විසින් පවසන ලද්දකි.

## සිංහල - II - පිළිතුරු පත්‍රය I කොටස

(01) (ලකුණු 1 × 20 = 20)

| | | | | | | |
|---|---|---|---|---|---|---|
| (1) 03 | (2) 05 | (3) 04 | (4) 02 | (5) 01 | (6) 03 | (7) 05 |
| (8) 04 | (9) 01 | (10) 02 | (11) 02 | (12) 03 | (13) 05 | (14) 02 |
| (15) 03 | (16) 04 | (17) 05 | (18) 04 | (19) 01 | (20) 02 | |

II කොටස

(02) (අ) (i) විනය ශික්ෂාපදයක් පිළිබඳ ව

(ii) මහදැළියාතිස්ස නම් භික්ෂුව දඹදිව වජ්ජිපුත්‍රක නිකායට අයත් ධම්මරුචි නිකායේ ඉගැන්වීම් පිළිගැනීමයි.

(iii) සංස්කෘත භාෂාවෙන්

(iv) මහාවංශය, නිකාය සංග්‍රහය, සමන්තපාසාදිකාව (මේ ග්‍රන්ථ තුන සඳහන් විය යුතුයි. ත්‍රිපිටකය යන්න ග්‍රන්ථයක් ලෙස නොගත යුතුයි)

(v) ධර්මධර භික්ෂුවක් පත් නොකොට භාෂාන්තරයන්හි / භාෂාවන්හි දක්ෂ ගිහියකු පත් කිරීම නිසා.

(vi) අභයගිරිවාසී භික්ෂූන් - මහායානය / මහායාන සම්ප්‍රදාය
මහාවිහාරවාසී භික්ෂූන් - ථෙරවාද / ථෙරවාදී සම්ප්‍රදාය

(ලකුණු 2 × 6= 12)

(ආ) පහත කරුණු සාරාංශයෙහි අන්තර්ගත විය යුතුයි.

* විසිවන සියවසේ අග්‍රගණ්‍ය නාට්‍යකරුවා බෙර්ටෝල්ට්බ්‍රෙච්ට් බව විචාරක මතයයි.
* ඔහු ස්වාධීන නිර්මාණාත්මක බුද්ධියකින් හෙබි කලාකරුවකු බව ඔහුගේ කෘති විවේචනය කරන්නෝ ද පිළිගනිති.
* බ්‍රෙච්ට්ගේ නාට්‍ය බොහෝමයක් විශ්ව සම්මානයට පාත්‍ර විය.
* බ්‍රෙච්ට්ගේ නාට්‍ය කිහිපයක් සිංහලට පරිවර්තනය විය.
* ඇතැම් සිංහල නාට්‍යකරුවන්ගේ ස්වාධීන කෘති කෙරෙහි බ්‍රෙච්ට්ගේ රංග ශෛලිය බලපා තිබේ.
* නාට්‍ය කලාව පිළිබඳ බ්‍රෙච්ට්ගේ මතවාද හා රංග ශෛලිය අපරදිග නාට්‍ය කලාවට බලපෑවේ ය.
* ආධුනික හා ප්‍රවීණ නාට්‍යකරුවන් මෙන් ම විචාරකයන් ද බ්‍රෙච්ට්ගේ මතවාද කෙරෙහි අවධානය යොමු කළහ.

ඉහත කරුණු ඇතුළත් ව ලේඛන ව්‍යවහාරයෙන් සාරාංශය ලියා තිබිය යුතු ය. සාරාංශය එක් ඡේදයක් ලෙස දක්වා තිබිය යුතු අතර, ඡේදවලට බෙදා ඇත්නම් සමස්තයෙන් ලකුණු දෙකක් අඩු වේ. වචන සංඛ්‍යාව 60 - 70 අතර තිබිය යුතු ය. එම ප්‍රමාණය අඩු හෝ වැඩි හෝ වේ නම් වචන ප්‍රමාණයට ලකුණු 2ක් අඩු වේ.

නියමිත වචන ප්‍රමාණයට - ලකුණු 02 යි.
භාෂා නිරවද්‍යතාවයට - ලකුණු 03 යි.
අන්තර්ගතයට - ලකුණු 08 යි. (ල. 13)

(03) රචනා සංඛ්‍යාව 300 - 350 අතර වේ නම් ඉහළ ලකුණක් ප්‍රධානය කළ හැකි ය. වචන 400 ට වැඩි වේ නම් හෝ 250ට අඩු වේ නම් හෝ ලකුණු 03ක් අඩු කළ යුතු වේ.
වාක්‍ය රචනයට ලකුණු දීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි අවධානය යොමු කිරීම සුදුසු ය.

(i) රචනය සඳහා තෝරා ගත් මාතෘකාව යටතේ ප්‍රමාණවත් ලෙස කරුණු ඒකරාශීකරණය.

(ii) එම කරුණු සංවිධානාත්මක ව ඉදිරිපත් කිරීම.

(iii) කරුණුවල පැහැදිලි බව.

(iv) නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනුගමනය කිරීම.

(v) ව්‍යාකරණ දෝෂ රහිත වීම.

(vi) භාෂාව ව්‍යක්ත ලෙස හැසිරවීම.

(vii) සුදුසු ලෙස පද බෙදීම හා ඡේද වෙන් කිරීම.

(viii) කියවිය හැකි සේ අත්අකුරු පැහැදිලි වීම.

විවිධ භාෂාත්මක ප්‍රයෝග භාවිතය (උපමා, රූපක, ආප්තෝපදේශ, ප්‍රස්ථාව පිරුළු වැනි අංග කෙරෙහි සැලකිල්ල යොමු කරන්න.ඒ වෙනුවෙන් වෙන වෙන ම ලකුණු දීම නොකළ යුතු ය. සමස්තයක් ලෙස සලකා ලකුණු ප්‍රදානය කළ හැකි ය. (ලකුණු 25 යි.)

(04) (අ) (i) දේශපාලකයන් රට උගසට තබති'යි ඇතැම්හු කියති.

(ii) ශිෂ්‍යයෝ බොහෝ දෙනෙක් ගුරුවරුන් අගය කරති.

(iii) සැකකරුවෝ නිදහසට කරුණු දැක්වූහ.
(iv) නිවැරදි වාක්‍යයකි.
(v) නිවැරදි වාක්‍යයකි. (ල. 1 × 5 = 5)

(ආ) (i) අපේක්ෂකයන් විසින් ඇප මුදල් තැම්පත් කෙරිණි / කෙරුණේය / කනු ලැබීය / කරනු ලැබිණි / කරන ලදී / කරන ලද්දේ ය.
(ii) ඇතැමුන් විසින් වාණිජ පරමාර්ථයෙන් වෘක්ෂලතාවෝ විනාශ කෙරෙති / කරනු ලබති / කරනු ලැබෙති.
(iii) වඳුරන් විසින් බළලුන් ලවා කොස් ඇට බෑවෙයි / බාවනු ලබයි / ලැබේ.
(iv) ඉන්දියානුවන් විසින් චන්ද්‍රයාන් - 3 සඳ මතට පතිති කැරැවිණි / පතිත කරවනු ලැබීය / ලැබුවේ ය / කරවුනු ලැබිණි / කරවන ලදී / කරවන ලද්දේ ය.
(v) ආණ්ඩුකාරවරයා විසින් ප්‍රධාන අමාත්‍යාංශයට ලේකම්වරියක් පත් කෙරුණා ය / කරනු ලැබුවා ය / කරන ලද්දී ය. (ල. 1 × 5 = 5)

(ඉ) (i) ඔතොමෝ - කළා ය /ඕතුමූ - කළෝ ය (ii) ගායකගායිකාවෝ - දෙනෙක්
(iii) සේවකයන් - බලධාරීහු (iv) දෙදෙනෙකු - කැඳවී ය
(v) වහන්සේ - වඩිති (ල.1 × 5 = 05)

(05) (i) සමෘද්ධිමත් - තද්ධිත - අස්ත්‍යාර්ථයේ තද්ධිත / ඇත්තේය යන අර්ථය
ගොඩනඟනු වස් - ක්‍රියා - අපර ක්‍රියා
ලක්වැසියන් - විභක්ති - කර්තෘ විභක්ති
(ii) වනවාසී - සමාස - විභක්ති සමාස / ආධාර විභක්ති සමාස
ජනතාවගේ - විභක්ති - සම්බන්ධ විභක්ති / සබඳ විහත්
ගෞරවාදරයට - සන්ධි - සමාන ස්වර දීර්ඝ සන්ධිය / ස්වර්ණ දීර්ඝ සන්ධි
(iii) නුවනග - සන්ධි - ස්වර සන්ධිය / සර සඳ
බැලුම් - කෘදන්ත - භාවකාරක කෘදන්ත
දිදී - මිශ්‍ර ක්‍රියා
(iv) පානීය - කෘදන්ත - සුදුසු / යෝග්‍ය යන අර්ථය
දුර්ලභ - උපසර්ග - දුෂිතාර්ථයේ උපසර්ග
ය - නිපාත - වාක්‍ය සමාප්ති නිපාත
(v) විසින් - නිපාත - විභක්ත්‍යාර්ථ නිපාත
ජනතාව - තද්ධිත - සමූහාර්ථයේ තද්ධිත
නිරතුරු - සන්ධි - ආගම සන්ධිය / ආගම් සඳ (ල. 3 ×5 = 15)

06 (අ) (i) සුගන්ධ (ii) ආහාර (iii) ප්‍රේම
(iv) අහර (v) සුවඳ (vi) පෙම (ල. ½ × 6 =03)

(ආ) මේ දිනවල පවතින දැඩි නියඟය නිසා ඉවසිය නොහැකි උණුසුමක් දැනෙයි. (ල. ½ × 6 =03)

(ඉ) (i) ජනතාවට - සම්ප්‍රදාන විභක්ති
රජයේ - සම්බන්ධ විභක්ති
(ii) දෙවඟනක - කර්ම විභක්තිය
රූපයෙන් - කරණ විභක්තිය
(iii) ළදරුවා - ප්‍රථමා විභක්තිය
තොටිල්ලෙහි - ආධාර විභක්තිය (ල. ½ × 6 =03)

(ඊ) ප්‍රදේශවාසී තරුණතරුණියනි, ''තරුණ අරුණ'' වැඩසටහන ජූලි මස 9 වන දින ප.ව. 2.00 - 6.00 දක්වා වස්ගමුව සුදර්ශන ශාලාවේ දී පැවැත්වේ. (ල. ½ × 6 =03)

(උ) (i) තමා එවර ඔහුට සමාව දෙන බව රුවන් පැවසුවේය.
(ii) පෙර දින ඔහු සිටි ස්ථානය ගැන පොලිසිය අමල්ගෙන් විමසීය.
(iii) ඒ තත්ත්වය මත ශ්‍රී ලාංකික තරුණ ප්‍රජාව රට හැර යනු ඇති බව මහාචාර්යවරයා කීවේ ය.
(ල. ½ × 6 =03)

07. (i) අනුලාදේවී , අරිට්ඨ, ථූපාරාමය, මිහිඳු, ලොවාමහාපාය , සපුමල්, සම්මිත්ත
(ii) රජ්ජුරුවෝ - හල්පිල්ල , කෙටිපාපිල්ල, කෙටිපාපිල්ල, කොම්බුව හා ඇලපිල්ල සහිත දීර්ඝත්ව ලක්ෂණය / හල්පිල්ල
තෙරණින් - කොම්බුව , කෙටි ඉස්පිල්ල, හල්පිල්ල
සැලී - කෙටි ඇදය, දීර්ඝ ඉස්පිල්ල

(iii) ඉක්බිති , සමඟ , නම් , ද , හා , සේක

(iv) ගාත්‍රාක්ෂර ලෝප - සම්මිත්ත

ගාත්‍රාදේශ - පන්සියයක්

ආගම - සමීපයෙහි / බැයණුවෝ .......

(v) අරිට්ඨ (ල. 03 × 05 = 15)

08. (i) අඝෝෂාක්ෂර :

අක්ෂර උච්චාරණයේ දී ස්වර තන්තු ලිහිල් ව පිහිටා ඇති විට නින්නාද නොවී / ඝෝෂාවකින් තොර ව නිකුත් වන ශබ්ද සහිත අක්ෂර අඝෝෂාක්ෂර වේ.

සිංහල හෝඩියේ අඝෝෂාක්ෂර 15 කි. / විසර්ගය - (අ) ඃ

ක , ච , ට , ත , ප - අඝෝෂ අල්පප්‍රාණ

ඛ , ඡ , ඨ ,ථ , ඵ - අඝෝෂ මහප්‍රාණ

ශ , ෂ , ස , ෆ යන ඌෂ්මාක්ෂර අඝෝෂාක්ෂර වේ. (ල. 5)

(ii) පර රූප සන්ධිය :

සන්ධි වන පද දෙකෙන් පර පදයේ (පසු පදය) මුල අක්ෂරයට සමාන අක්ෂර රූපයක් පූර්ව පදයේ (පෙර පදය) අග අක්ෂරය වෙනුවට පැමිණ වීමෙන් පද ගැළපීම සිදු වේ.( මෙම සන්ධි විධිය සිදත් සඟරාවේ දක්වා නොමැත)

උදා : ඇත් + දළ → ඇද්දළ

සත් + දවස → සද්දවස

ගොප්(බ්) + කොළ → ගොක්කොළ

දුක් + පත් → දුප්පත්

අත් + ලස් → අල්ලස් (ල. 5)

(iii) ප්‍රයෝජ්‍ය ක්‍රියා :

කෙනෙකු ලවා කරවන ක්‍රියාව ප්‍රයෝජ්‍ය ක්‍රියාවයි. ක්‍රියා ධාතුවෙන් (ධාතු ප්‍රකෘත්තියෙන්) පරව 'ව' ප්‍රත්‍යය යෙදීමෙන් ප්‍රයෝජ්‍ය ක්‍රියා ශබ්දය සෑදේ. (සිදත් සඟරාවේ '' පියදු කිරිය'' ලෙස මෙය නම් කර තිබේ.

* ප්‍රයෝජ්‍ය ක්‍රියාවේ දී ඇතැම් ක්‍රියා රූපවල වෙනස්කම් ඇති වේ.

උදා: බොයි → පොවයි (බ → ප බවට)

දකියි → දක්වයි (ඉ → ලොප් වී ඇත)

පෙනෙයි → පෙන්වයි ( එ → ලොප් වී ඇත)

* ප්‍රයෝජ්‍ය කර්තෘ සමඟ ''ලවා'' යන නිපාතය බෙහෙවින් යෙදේ.

- ජනතාව දේශපාලකයන් ලවා රට කරවති. / කරවයි

↓ ↓

ප්‍රයෝජක කර්තෘ ප්‍රයෝජ්‍ය කර්තෘ

- ගොවීහු මීහරකුන් ලවා කුඹුර සාවති.

- ගුරුතුමිය සිදුන් ලවා චිත්‍ර අන්දවයි. (ල. 5)

(iv) විභක්ති සමාස :

ප්‍රථමා සහ ආලපන විභක්ති හැර අනෙක් විභක්ති හතෙහි අර්ථ ගැන් වූ පදයක් පූර්වයෙන් යෙදී පරපදයක් හා සමාස වීම විභක්ති සමාස නම් වේ.

උදා:

කර්ම විභක්ති සමාස - ගත්කරු , කම්කරු , ගොපලු (ගවපල්)

කර්තෘ විභක්ති සමාස - වේපස් , ගුරුපදේශ , බුද්ධභාෂිත , පරපුටු

කරණ විභක්ති සමාසය - මල්කම් , මැටිබඳුන්, කිරිබත්, අත්කම්

සම්ප්‍රදාන විභක්ති සමාසය - ශිෂ්‍යාධාර , ගුරුපඬුරු, ළමානිවාස

අවධි විභක්ති සමාසය - රටහාල් , මුහුදුමාළු , සොරබිය

සම්බන්ධ විභක්ති සමාසය - මව්සෙනෙහස , බලුවලිගය, සුරබොජුන්

ආධාර විභක්ති සමාසය - ගැමිලිය, දහම්සොඬ , දියසුළි (ල. 5)

(v) මුව , මය තද්ධිත ප්‍රත්‍යය :

එයින් කෙරුණු , එයින් කරන ලද යන අර්ථයෙහි යෙදේ.

''මුවා'' ප්‍රත්‍යය බහුල වශයෙන් තද්භව පද සමඟ යෙදේ.

දඬු + මුවා → දඬුමුවා , රිදී + මුවා → රිදීමුවා

මිණි + මුවා → මිණිමුවා

''මය'' ප්‍රත්‍යය බහුල වශයෙන් තත්සම පද සමඟ යෙදේ.

ස්වර්ණ + මය → ස්වර්ණමය, රජත + මය → රජතමය

ශිලා + මය → ශිලාමය (ල. 5)

හැඳින්වීමට ලකුණු 02යි. උදාහරණවලට ලකුණු 03 යි. (ල. 03 × 05 = 15)